**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්**

**........................................................ පවත්වාගෙන යන**

**සමෘද්ධි සුව බොජුන්හල /අලෙවි මධ්‍යස්ථානයේ අලෙවි කටයුතු කිරීමේ ගිවිසුම් පත්‍රය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ 4වන මහළ, සෙත්සිරිපාය (1 අදියර), බත්තරමුල්ල යන ලිපිනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි 2017 අංක 2 දරණ පනතින් සංශෝධිත 2013 අංක 1 දරණ දිවිනැගුම පනත යටතේ ස්ථාපිත **සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව පළමු පක්ෂයට** ද,................................................................................................ යන ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක .................................... දරන ...................................................................................................................... යන අය දෙවන පක්ෂයට ද බැඳී ඒ දෙපක්ෂයේ සම්පූර්ණ කැමැත්ත සහ එකඟතාවය මත එම දෙපක්ෂය අතරේ කරගත් ගිවිසුමයි.

ඉහත කී පළමු පක්ෂය විසින් ........................................................................................ පවත්වාගෙන යන සමෘද්ධි සුව බොජුන්හලෙහි ආහාර ද්‍රව්‍ය සකස්කර විකිණීම සඳහා දෙවන පක්ෂයට ලබා දීමටත්, එකී දෙවන පක්ෂය විසින් එම ස්ථානයේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හා විකිණීමත් වෙනුවෙන් එකී දෙපක්ෂය විසින් මෙහි පහත සඳහන් පොරොන්දු ගිවිසිලි වලට යටත්ව මෙම ගිවිසුමට එළඹෙන ලදී.

ඉහත කී පොරොන්දු ගිවිසිලි කවරේද යත් :-

01. මෙම ගිවිසුම වර්ෂ 20... ක් වූ ............................ මස ........ දින සිට වර්ෂ .............. ක් වූ .............................. මස ................ දින දක්වා වූ මාස දොලහක (මාස 12)ක කාලයක් සඳහා බව දෙපක්ෂය පිළිගනී.

02. මෙකී බදු කාල සීමාව තුළ එක් වෙළඳ කාල රාමුවක් සඳහා අවමව රුපියල් දෙසීය (රු.200/-) ක් බැගින් වූ දෛනික බදු කුලියක් දෙවන පක්ෂය විසින් පළමු පක්ෂය වෙත සෑම දිනයක දීම ගෙවිය යුතුය.

03. මෙම සමෘද්ධි සුව බොජුන්හල තුළ දෛනිකව ආහාර නිෂ්පාදනය කිරීම හා අළෙවිය සිදු කිරීම / අනුමත වෙනත් නිෂ්පාදන අලෙවි කිරිම ඉහත දෙවන පක්ෂය විසින් සිදු කළ යුතු අතර, එසේ කිරීමට දෙවන පක්ෂයට අපහසු වන දිනයකදී හෝ දිනයන්හි දී එම කටයුතු ඉටුකිරීම සඳහා වෙනත් අයෙකු .......................... සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කළමනාකරුගේ පූර්ව ලිඛිත අනුමැතිය මත පමණක් යෙදවිය හැකි අතර, දෛනිකව ආහාර නිෂ්පාදනය කිරීම හා අළෙවිය සිදු කිරීම සම්බන්ධයෙන් නම් එකී තැනැත්තිය පළමු පක්ෂය විසින් මේ සම්බන්ධයෙන් ලබාදෙන ලද පුහුණු වැඩසටහන සඳහා සහභාගී වූ අයෙකු වීම අනිවාර්ය වේ.

04. මෙම සමෘද්ධි සුව බොජුන්හල සඳහා වැයවන මාසික විදුලි හා ජල බිල්පත් සෑම මාසයකම හිඟ නොවන ආකාරයෙන් ගෙවීමත් මධ්‍යස්ථානයේ සිදුකළ යුතු

රු.5,000.00 නොඉක්මවන සුළු නඩත්තු කටයුතු සිදුකිරිමත් දෙවන පක්ෂය විසින් කළ යුතුය.

05. පළමු පක්ෂය වෙනුවෙන් ................................ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හෝ අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව විසින් බලය පවරනු ලබන ඕනෑම අයෙකු විසින් පරීක්ෂා කිරීම සඳහා දෙවන පක්ෂය විසින් අවසර දිය යුතු අතර ඊට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ද පරීක්ෂාකරනු ලබන බව දෙපාර්ශවය පිළිගනී.

06. මෙම සමෘද්ධි සුව බොජුන්හලෙහි දෙවන පක්ෂය විසින් අලෙවි කරනු ලබන ආහාර වර්ග පළමු පක්ෂය විසින් අනුමත කරන ලද ආහාර වර්ග පමණක් වියයුතු අතර, ඒවායේ අලෙවි මිල ගණන් ද පළමු පක්ෂය විසින් නියමකරනු ලබන මිල ගණන් විය යුතු බවට දෙවන පක්ෂය එකඟ වේ.

07. ආහාර ද්‍රව්‍ය පිරිසිදුව ගුණාත්මක භාවයෙන් යුතුව, පළමු පක්ෂය විසින් සපයනු ලබන නිර්ණායක වලට යටත්ව පිළියෙල කිරීම ද, ආහාරපාන සම්බන්ධයෙන් ජනතාව විමසීම් කරන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් වූ නිවැරදි සම්පූර්ණ තොරතුරු ලබා දීමටත්, දෙවන පක්ෂය පොරොන්දුව බැඳේ.

08. අලෙවි කරනු ලබන ආහාරපාන හේතුවෙන් හෝ පවත්වාගෙන යනු ලබන උපකරණයකින් යම් පුද්ගලයෙකුට හෝ දේපලකට අලාභයක් හානියක් පාඩුවක් සිදුවුවහොත් එකී අලාභ හානි සහ පාඩු වලින් පළමු පක්ෂය නිදහස් කොට තැබීමටත්, අදාල අලාභය වහාම අදාල පාර්ශවයට ගෙවීමටත්, දෙවන පක්ෂය එකඟ වේ.

09. පළමු පක්ෂය විසින් දෙවෙනි පක්ෂයට භාර දී ඇති භාණ්ඩ අලාභ හානි වලින් තොරව යථා තත්වයෙන් ගිවිසුම් ගත කාලය අවසානයේදී පළමු පක්ෂය වෙත භාර දීමට දෙවන පක්ෂය එකඟ වේ.

10. දෙවන පක්ෂය වෙත භාරදී ඇති සුව බොජුන් අළෙවිසැලේ ස්ථානය අවශ්‍ය විටෙක ලිත් මාසයකට පෙර ලිඛිත ලියාපදිංචි දැන්වීමක් කර පළමු පක්ෂයට ලබා ගැනීමට අයිතිය ඇති බව දෙවන පක්ෂය එකඟ වේ.

11. ඉහත කී 10 වන කොන්දේසිය පරිදි හෝ ගිවිසුම් ගත කාලය අවසානයේදී හෝ අදාල ආහාරපාන අලෙවිය පවත්වාගෙන යන කොටසේ හිස් නිරවුල් බුක්තිය ආපසු පළමු පක්ෂය වෙත උපලේඛණ ගත කර භාරදුන් භාණ්ඩද, සමඟ වහාම භාර දීමට දෙවන පක්ෂය වැඩිදුරටත් එකඟව ගිවිස ගනී.

12. දෙවන පක්ෂයට සුව බොජුන්හලේ අලෙවි කටයුතු වලින් ඉවත් වීමට අවශ්‍ය නම් ඒ බව ලිත් මාසයකට පෙර ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් පළමු පක්ෂයට දන්වා ද, හදිසියේ ඉවත් වීමට සිදුවුවහොත්, ඉදිරි මාසයට අදාල ගාස්තුව පළමු පක්ෂයට ගෙවා උපලේඛණ ගත භාණ්ඩද සමඟ සුව බොජුන්හලේ අදාල භූමියේ හිස් නිරවුල් භුක්තිය ආපසු පළමු පක්ෂයට භාර දීමට දෙවන පක්ෂය එකඟ වේ.

13. සෑම දිනකම අවමව පෙ.ව.7.00 සිට ප.ව.1.00 දක්වා ද, ප.ව.1.00 සිට ප.ව.7.00 දක්වා කාලසීමාව තුල හෝ අධීක්ෂණ හා ප්‍රගති සමාලෝචන කමිටුව විසින් නියම කරනු ලබන කාලසීමාව තුල හෝ අලෙවි කටයුතු සිදුකල හැකි අතර අදාල කාල සීමාව තුල දෙවන පක්ෂය වෙත වෙන් කළ ස්ථානයේ අලෙවි කටයුතු අඛණ්ඩව

පළමු පක්ෂයට අපකීර්තියක්, හානියක්, පාඩුවක් නොවන අයුරින් සදාචාරාත්මකව ඉටු කිරීමට දෙවන පක්ෂය එකඟ වේ.

14. අලෙවි පියසේ දෙවන පක්ෂයට අයත් කොටස අතුරු බද්දකට, අතුරු කුලියකට, උගසට ආදියකට වෙනත් පාර්ශවයකට ලබා නොදීමත්, පළමු පක්ෂයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ඉදිකිරීම් කටයුතු නොකිරීමටත්, දෙවන පක්ෂය තරයේ පොරොන්දු ගිවිස ගනී.

15. පළමු පක්ෂය විසින් හඳුන්වා දී ඇති ඇඳුම් කට්ටලයෙන් සැරසී සිටීමත්, පළමු පක්ෂය විසින් දෙවන පක්ෂයට ලබා දී ඇති හැඳුනුම්පත අලෙවි කටයුතු කරන සෑම විටම පැළඳ සිටීමත් දෙවන පක්ෂය එකඟව ගිවිස ගනී.

16. ගිවිසුම් කොන්දේසි කඩකරනු ලබන ඕනෑම විටක පූර්ව දැනුම් දීමකින් තොරව දෙවන පක්ෂය ඉවත් කිරීමට අයිති ඇති බව දෙවන පක්ෂය පිළිගනී.

තවද ඉහත සඳහන් පොරොන්දු හරියාකාර ඉෂ්ඨ කිරීම පිණිස ඉහත කී පළමු පක්ෂය හා දෙවන පක්ෂය ද ඒ දෙපක්ෂය වෙනුවට සහ ඒ දෙපක් ෂයේ උරුමක්කාර, පොල්මඃකාර අද්මිනිස්ත්‍රාසිකාර බලකාර ලැබුම්කාරයන් වෙනුවටත් එකිනෙක පක්ෂය සමග වැඩිදුරටත් පොරොන්දුව බැඳුනේය.

ඊට සාක්ෂි පිණිස ඉහත කී පළමු පක්ෂය වෙනුවෙන් එකී ආයතනයේ ...................... දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ................................................................................ යන අය ද, දෙවන පක්ෂය වන ........................................................ යන අය ද වර්ෂ දෙදහස් ................(.............) ක් වූ ....................... (...........) මස .......... වන දින ....................................................................... දී අත්සන් තබන ලදී.

**පළමු පක්ෂය**

1.

2.

**දෙවන පක්ෂය**

1.

2.